




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමග බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

# කුලී කාමරයක සිව් දෙනෙක් සහ සඳ

**තාත්තා :**

**නුරා කල්පනාවල ඉහිරුණු සිහින**
**පරාද කරනෙමි දුව-පුතු ලොකු බැවින**
**ඉරා රැය අදත් ඇවිදින් සඳ මුහුණ**
**සරාගයේ අන්තිම පෙළටත් රවන**

**අම්මා :**

**දුව දෙස බැලිමි දුව සිහිනෙක කිමිදේයා**
**පුතු දෙස බැලිමි පුතු නිදි ලොව පතුලේයා**
**සඳ දෙස බැලිමි සඳ වත දැඩි අඳුරේයා**
**හිමි දෙස බැලිමි හිමි ඇත මොකවත් නොකියා**

**පුතා:**

**දවල් දුටු සඳක් රෑ හොල්මන් කරන**
**මෙවන් රෑ කොතෙක් පුරුදුද නිදි වරන**
**වරක් පැමිණියේ නම් සුන්දර බිරම**
**සඳක් ගෙන හිතට පහසුය දිය කෙරුම**

**දුව :**

**එවා රැයේ අන්තිම කෙටි පණිවිඩය**
**මවා ගම් සඳේ ඔබ නිදි ඇති විදිය**
**පමා නොවී එළැඹුණු විට හෙට දිනය**
**සොයා එමි උදේ මට හිමි සඳ එළිය**

## මහින්ද ප්‍රසාද් මස්ඉඹුල

'ඇහි පියන් ඇහැරිලා' කාව්‍ය සංග්‍රහය - 2012

එකම භෞතික අවකාශයක දැහැන් ගතවූ සිව් දෙනෙකු හට එකම නිමේශයක එකම භෞතික වස්තුවක් විවිධාකාර ලෙස වස්තු විෂයයික වන හැටි නිර්මිත කවි පෙළකි මේ. ස්ථානය කුටුම්භයයි. එනම් කුලී කාමරයකි. දැහන්ගත වූවෝ නම් තාත්තා, අම්මා, පුතා හා දුව නම් චරිත හතර වෙති. ඔවුන්ගේ පොදු මාතෘකාව සඳකි. එය වෙන වෙනම එකිනෙකා වෙත වේදනා, සංවේදනා, මතක හා බලාපොරොත්තු නිර්මාණය කරමින් එක්තරා රාත්‍රියක අහසේ එල්ලෙමින් පවතී. රාත්‍රී අහසක ලඹ දෙන සඳක් මිනිස් සමූහයකට මෙලෙස බලපෑම් කරන හැටි අපූරුය. නමුත් සඳ ඒ දේ නොදනී. එය හුදෙක් අප සඳ සමඟ කරන ඒක පාර්ශ්වික හැඟීම් මාත්‍රීය ගනු දෙනුවක් පමණි. නමුත් ඒ තුළ අපි සුවයක් මෙන්ම වේදනාවන්ද ලබන්නෙමු.

කවියේ පළමු කොටසෙන් පෙරට එන්නේ තාත්තාය. ඒ රාත්‍රියේ සියල්ලන් නින්දට ගිය මොහොතකය. සියල්ලන්ම නිදි සුව විඳිමින් නොවිඳිමින් සිටින මොහොතක තාත්තා අවදියෙනි. දහසකුත් නුරා කල්පනාවන් පහල වෙමින් ඔහුගේ හිත ඔද්දල් වී ඇත. ඒ කල්පනාවෝ ඔහුගේ නින්ද උදුරා ගනිති. ජීවිතයේ මැදියම පසුකරගෙන යන මොහොතක වුව අනුරාගී සිතුම් ඇවිදින් මිනිසුන් අවදියෙන් තබන හැටි ජීවිතයේම ලස්සන අපට කියාදේ. ඒ සිතුම් කල්පනාවන් හා හැඟුමන් අතර සැරිසැරීම මැදිවියේ දී අකැපද? අව්‍යාජව හිතට නැඟෙන කුමන හෝ නිදහස්කාමී හැඟීම් මාත්‍රයක ටිකකට හෝ නතර වී යන්නට අපට අවසර නැද්ද? තාත්තෙක් වූවද මේ මනුස්සයෙකි. මස් ලේ වලින් සැදුණ, හැඟුමන් වලට සංවේදී මිනිසෙකි. නමුදු කුටුම්භය නම් ඒකකය තුළ ඔහුට ඔහුගේම සිතුවිලි දාමයක නිදහසේ කරක්ගැසිය නොහැක. පවුල නම් ඒකකය තුළ ඒ අපව වක්‍රව පාලනය වන ආකාරයයි. එහි වරදක් නැත. වරදක් නැත්තේද නැත. මෙලෙස රාත්‍රියේ හිතට නැඟෙන නුරා කල්පනාවන් ඔහුව අසහනයට පත් කළද, ඔහුට හිත හදාගෙන අඩුම තරමේ ඒ සිතිවිලි සුව විඳින්න වත් බැරි කරන්නේ ඔහු අවටින් නින්ද සොයමින් සිටින සිය පවුලයි. හැඟීම් ඇවිළුණු මොහොතක ඔහුට සිතූ සැනින් එවා බෙදා හදා ගන්නට, සමනය කරගන්නට මේ පුංචි කුලී කාමරයේ ඉඩ හසර නැත. එය එකම එක කාමරයකි. සියල්ලන්ම එකට නිදියන පුංචි වපසරියකි. ඔහුට ඒ වෙනුවෙන් බාධා කරන්නේ වැඩි වියට පත්ව සිටින දුව හා පුතාය. ඒ ඔහු සිතන හැටිය. මේ එවන් ආස්වාදනයකට සුදුසුම මොහොත නොවේ. මෙන්න මේ වෙලාවට ඔහුට දැක ගත හැක්කේ අඳුර ඉරාගෙන ගෙට එබෙන සඳ වතයි. එය ඔච්චමට හිනාවෙනවා වැනිය. නුරා සිතුම් අවුළුවා ලූ සඳම දැන් ඔහුගේ නොහැකියාව හමුවේ සමච්චලයට හිනා වෙනවා වැනිය. සාරාගයේ අන්තිම පේළියටත් රවමින් ඒ වෙනුවෙන් පුංචි හෝ ඉඩක් නැති බව කියා ඔහුව අසරණ කරන්නේ ඒ නුරා සඳමය.

කවියේ දෙවන කොටස අපව වෙනමම ඉසව්වකට රැගෙන යයි. ඒ අම්මාය. අහසේ දුලන සඳ ඈ වෙත ගෙන ආවේ නුරා හැඟුමන් නම් නොවේ. එය කළු වලාවකින් වැසී ගොසිනි. සඳ වත දැඩි අඳුරක බව ඈට පෙනේ. ඈට නිදි පැදුරු දෙස බැලූ විට පෙනෙන්නේ දෙදරුවන් සිහින ලොව සරමින් නිදි සුව විඳින බවකි. ඔවුන් දෙස මොහොතක් බලා හිඳින විට, මේ කුලී කාමරයේ එකට ගුලිවී ගෙවන දුෂ්කර ජීවිතය ගැන හිතෙන විට ඈට සිතෙන්නේත් තමනුත් කළු වලාවෙන් වැසී ගිය දැඩි අඳුරේ පසුවන සඳ වාගේම බවයි. ඈ මොහොතක් තම සැමියා දෙසට හැරී බලා දෙබසකින් තොරව මේ හැඟීම් මාත්‍රය බෙදා ගන්නට බලයි. වෙනම සිතුවිලි සමුදායකින් තෙහෙට්ටුවට පත්ව සිටින ඔහු මුකුත්ම කියන්නේ නැත. එය ඈ නොසතුටු කරයි. පසුතැවීමකට ලක් කරයි. නිදි සුව විඳින දරුවන්ගේ අධ්‍යාපනය ගැන, අනාගතය ගැන, කොටින්ම කිව්වොත් වේගයෙන් කල වයස කරා ළං වන ඔවුන්ගේ හෙට දවස ගැන සහසකුත් බලා පොරොත්තු ඈ වෙත ඇත. කුලී කාමරයකට උඩින් එබෙන සඳකට තාවකාලිකව වත් ඒ අඳුරු පටලයන් ඉරා දමා මොහොතක සිනාවක් වත් ඒ ඒ මුහුණු වල තවරවන්නට නොහැකි වී ඇත්තේ ඔවුන්ගේ ඇත්තම ජීවිතයේ අඳුරු වලාවන් බහුල බැවිනි. නමුත් එය මගහැර යා නොහැක. සැමියා මුවින් නොබැන සිටියද ඒ නිහඬතාවය තුළ පවා ඇත්තේ වචන දහසක් කතාවකි. 'සඳ ඇබින්දක් ඇතියි' කියා ඒ යතාර්ථය මගහැර සෑහීමකට පත්විය නොහැක. 'මුළුමනින් පායලා' ආවත් ඔවුන්ගේ ජීවිත වලට ඊට එහාට ගිය විසල් අඳුරක් සමඟ මුසුවූ සැබෑ ගනු දෙනුවක් ඇත.

කවියේ තෙවන කොටසේ ඉඩ වෙන්ව ඇත්තේ පුතා වෙනුවෙනි. වෙනමම භාව ලෝකයක සරන නව යොවුන් තරුණයෙකි ඔහු. හේ නිදි නැත. ඔහුගේම මතක හා සිහින අතර දෝලනය වෙමින් අඩ නින්දේම ඔහු පසුවේ. අහස් කුස හොල්මන් කරන සඳ ඔහුට ජනනය කරන්නේ අමුතුම සංවේදනාවකි. රාත්‍රී සඳක් වෙනුවට දිවා කල දුටු සඳක් ඔහුගේ සිහින අතර ලැගුම්ගෙනය. යෞවනෝදයෙන් පිරිපුන් තරුණයන් ගැහැනු ළමයින් කෙරේ ආකර්ෂණය වීමේ අරුමයක් නැත. දිවා යාමයේ දුටු එවන් රුවක සෙවනැල්ලක් දැන් ඔහුගේ නින්ද සොරාගෙනය. මෙය සුලභව චක්‍රීයව සිදුවන බවක් කවියෙන් ගම්‍ය වේ. මන්ද මේ නිදි මැරීම එතරම් අරුම නොවන බව පැවසීමෙනි. එහි සැඟවුණු අර්ථය නම්, වරින් වර වෙනස් වෙවී ඔහු සිත් ගත් ගැහැනු ළමයින්ගේ නේක රූ, දවසින් දවස සිහින සොරකම් කරනා බවකි. එක රූපයක් නොව, දුටු දුටු රූ කෙරේ ඇදී යන විවිධාකාර සුන්දරත්වයන්ට වහා ඇලෙන සුලු ඔහුගේ හිතේ ගතිකමය ස්වාභාවය ඉන් මනා ලෙස විද්‍යමාන වේ. ඒ නව යොවුන් වියේ හැටිය. කොතරම් නිදිවරා රැය පහන් කළද හෙට උදේ දකින වෙනත් රුවක් පසු පස දිව යෑමෙන් සිහිනයෙන් සිහිනයට එහි පාට වෙනස් වේ. ඔහු ඒ වෙනස ප්‍රිය කරන්නෙකි. හැමදාම අහසේ දකින එකම සඳ දැකුම ඔහුට නීරසය. ඔහුගේ ලෝකය වඩාත් පුළුල් විවිධාකාර සඳවල් වලට විවෘත වූවකි. වැහි බීරමක් වත් පැමිණියේ නම්, අහසේ එල්ලෙන ඒකාකාරී සඳ අරගෙන දිය කර දැමිය හැක. ඊනයින් වැහි බීරම පවා සුන්දර යැයි හේ පවසයි. ඒ හෙට දවසේ නැඟෙන අලුත්ම සඳ මුහුණක් වෙනුවෙනි.

කවියේ අවසාන කොටස පවරා ඇත්තේ දියණිය වෙනුවෙනි. ඈ ප්‍රේමයක ද්වාරය අසල සිටින, ආදරයම ජීවිතය කර ගත්ත නව යොවුන් කෙල්ලක් බව ඉඟි බිඟි මුළු කවියෙන්ම අපට සොයා පාදා ගත හැක. නිදි පැදුරේදී ඇගේ මවට ඈ කෙරේ වූ අනියත බියත් එයම විය හැක. ඈ සුන්දර, දුටු දුටුවන් මන බන්දන අපූරු දැරිවියක් විය යුතුය. නමුදු කවුරුත් නොදන්නේ මේ රත්‍රිය ඈටද නින්ද අහිමි කර ඇති බවය. රාත්‍රිය යනුම නින්දේ ඇරඹුමයි. නමුත් ඒ හිත සන්සුන් නම් පමණි. මේ පුංචි කාමරය තුළ සියලෝම නින්ද අහිමි කරගෙන සිටිති. ඔවුනොවුන්ට තමන්ගේ සිතත් සමග, දුර ඈත සඳ සමග වෙනමම භාෂණයක් ඇත. තැන තැන වෙන් වෙන්ව ඒ කසු කුසු හඬක් නොනඟාම බිඳී විසිරී යයි. ඇගේ ලොව සඳ අන් එකකි. ඒ අහස සරසන සඳ නොවේ. ඒ ඈ හිතගත් පෙම්වතාය. නින්දට පෙර පෙම්වතා වෙනුවෙන් 'සුබ රාත්‍රියක්' යැයි තම ජංගම දුරකථනයෙන් කෙටි පණිවිඩයක් යවා ඈ ඇස් පියා ගන්නේ ඔහු නිදි සුව විඳිනයුරු සිතින් මවා ගනිමිනි. ඔහු ඔහුට හිමි අවකාශයක නින්දට එළැඹෙනු ඇත. නමුත් දුරින් හිඳගෙන හෝ ඒ මොහොතට ළංවන්න ඈට පුළුවන් වන්නේ මෙසේ සිතින් ඒ බව අනුමාන කරගනිමිනි. එය ඉතාම ප්‍රේමනීය නොවන්නේද? ඈ සිහින සිතුවිලි ඔස්සේ ඔහුට තුරුල් වනු ඇත. ඇගේ ලෝකයේ සඳ ඔහුය. ඈට අනුව, කවුළුවෙන් එපිට නිකරුණේ දැල්වෙන්නේ නිකම්ම නිකන් පාෂාණ කැබැල්ලක් විය යුතුය. අවට සඳ එළිය පවා ඈට සුවිශේෂී නොවේ. ඈ ප්‍රාර්ථනා කරන්නේ රාත්‍රිය ඉතා කෙටි වන ලෙසයි. ඒ සුබ උදෑසනක් වෙනුවෙනි. ඈ පතන සඳ එළිය ඈට දැකගන්න ලැබෙන්නේ යළිත් හෙට උදයේය. ඒ ඇයගේ පෙම්වතාගේ සිනාව ඔස්සේය; සෙනෙහස හා උණුසුම ඔස්සේය. ඉදින් රාත්‍රියක නිකරුණේ ගලා හැලෙන සඳ එළියේ කවර නම් අරුමයක්ද?

කුටුම්භයක අපට හමුවන චරිත හා සකල ලොවක අඳුර පළවා හරින සඳ රූපකයක් ලෙස ගෙන ගොඩ නැංවෙන මේ කවිය විවිධ විශමාකාර සංවේදනා හා චින්තන කලාපයන් ආවරණය කරයි. නින්ද නම් පොදු සාධකය හමුවේ, නොනින්දේ ගොඩ නැංවෙන උන් උන් අතර පොළා පනින සිතුවිලි සංග්‍රාමයක් බඳු කවියකි මේ. අප සියලු දෙනාම සිතන්නේ පතන්නේ එකම ලෙසට නම්, ඒකාකාරීව නම් මේ ලොව මෙතරම් සොඳුරු වේද? එකම සඳක් අරභයා පවා විශම අර්ථකතනයන්ට යා හැකි වන්නේ අප තුළ ඇති මේ විවිධත්වය නිසා නොවේද? සුලභ යැයි බැලූ බැල්මට පෙනෙනා දෙයක් තුළින් මානව ජීවිත තුළ පවත්නා, ගොඩ නැංවෙන විවිධ පැතිකඩ ආවරණය කරන මේ කවිය අපටත් අපේ ලෝකයේ සඳ මොන වගේ දැයි සොයා ගන්නට පුංචි හෝ ජීවිතාවබෝධයක් ලබා නොදෙන්නේද?

